www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

ඒකක පරීක්ෂණය

10/11 ශ්‍රේණි | සිංහල සාහිත්‍ය සංග්‍රහය | ඒකකය 2 - ගුත්තිල වෙණ නද

(1) i) අ) ගුත්තිල කාව්‍ය රචනා වූ සාහිත්‍ය යුගය නම් කරන්න.
ආ) එම ග්‍රන්ථ රචකයා කවරෙකු ද?

ii) අ) ගුත්තිල කාව්‍ය ආරම්භ කොට ඇති විරිත හා කාව්‍ය ගණය ලියා දක්වන්න.
ආ) කවි සඳහා භාවිත විරිත යනු කුමක් ද?

iii) අ) ගුත්තිල ඇඳුරිඳු කවර නුවරක වැසියෙක් ද?
ආ) මූසිල ගුත්තිල ඇඳුරිඳු ගැන දන ගත්තෙ කෙසේ ද?

iv) අ) ගුත්තිල කාව්‍ය රචකයාගේ ගුරු හිමියන් කවරෙකු ද?
ආ) එතුමා හඳුන්වන ගෞරවනීය නාමය සඳහන් කරන්න.

v) අ) ගුත්තිල කාව්‍ය රචකයා ඒ සඳහා භාවිත කළ විරිත් දෙකක් දක්වන්න.
ආ) මෙම කාව්‍ය ආරම්භ කර ඇති විරිත හා බැඳුණු පාද හතරේ මාත්‍රා වෙන වෙනම දක්වන්න.

vi) අ) ගුත්තිල කාව්‍ය ආරම්භ කර ඇති කාව්‍ය ගණය හා බැඳුණු ලඝු මාත්‍රා හා දිගු මාත්‍රා කොපමණ ද?
ආ) ගුත්තිල කාව්‍ය හා සම්බන්ධ ජාතක කතාව දක්වන්න.

vii) අ) ගුත්තිල කාව්‍යයේ ඇති මුල කවි ගණන කොපමණ ද?
ආ) එම කාව්‍ය ලියා ඇති සමයේ මෙරට විසූ පාලකයා කවරෙක් ද?

viii) අ) වෑත්තෑවේ හිමියන්ට සිය අප්‍රසාදය පළ කිරීමට ගුරු හිමියන් කළ ක්‍රියාකාරකම කුමක් ද?
ආ)ඒ සඳහා ප්‍රතිචාර වශයෙන් වෑත්තෑවේ හිමියන් සිදු කළේ කුමක් ද?

ix) අ) වෑත්තෑවේ හිමියන් උපන් කෝරළය නම් කරන්න.
ආ) උන්වහන්සේ කිනම් පළාතක කිනම් ගම්පත්තුවක උපන් කෙනෙකු ද?

x) අ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට ආරාධනා කළේ කවරෙක් ද?
ආ) ඔහු එවක රජයේ කිනම් තනතුරක් දරා ඇත් ද?

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

Agaram.LK - Keep your dreams alive!

(2) i) නොදනම තමා          බල
සබයට අවුත් නොපැකිල
අ) මෙම කවියේ ඉතිරි පාද සම්පූර්ණ කරන්න.
ආ) කවියේ තෙවන පාදයේ වූ කාව්‍යාලංකාරය කුමක් ද?

ii) තැර මිණි බරණ       රැස්
රසින් සුරසැවු          සුවහස්
අ) කවියේ ඉතිරි පාද සම්පූර්ණ කරන්න.
ආ) අංකිත පදයන්හි අරුත් දක්වන්න.

iii) අ) මොණර පිල්වල වූ ඇස් කන් නොවීම ගැන කණගාටුවෙන් සිටි බව දක්වෙන කවිය සම්පූර්ණ කරන්න.
ආ) ''පිල්බර ගණ'' හා ''සඳැස් සවන්'' යන පද්‍ය වල අරුත් දක්වන්න.

iv) අ) ගුත්තිල වෙණ නදට යකුන් නටයි. ඒ බව කියැවෙන එක් කවියක් ලියා දක්වන්න.
ආ) එම කවියේ සරල අදහස ලියා දක්වන්න.

v) දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණියා.
අ) කවිය සම්පූර්ණ කරන්න.
ආ) එම කවියේ පාද හතරේ මාත්‍රා යෙදී ඇත්තේ කෙලෙසක ද?

agaram.lk

<u>විචාර ප්‍රශ්න</u>

(3) i) උපමා භාවිතය
ii) උචිත සජීවි අවස්ථා නිරූපණය ගුත්තිල කාව්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇති අයුරු පහදන්න.
(එකකට උදාහරණ දෙක බැගින් ගෙන වචන 125 ක් පමණ සැහේ)

(4) i) සරල බව කවියේ ආත්මය කර ගැනීම,
ii) අතිශයෝක්තිය අපූර්ව ලෙස භාවිත කිරීම වැත්තෑවේ හිමියන්ගේ කවීත්වය මොනවට ප්‍රකට කරයි. විස්තර කරන්න.
(එකකට උදාහරණ දෙක බැගින් ගෙන වචන 125 ක් පමණ සැහේ)

(5) ගුත්තිල වෙණ නද ....... කෙලෙසක බලපෑම් ඇති .. ද යන්න විස්තරයක් කරන්න. (උදාහරණ තුනක් පමණක් වචන 100 ක් සැහේ.)